රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 3000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි (පැරණි නිර්දේශය)

# ECN 3201 - G – ශ්‍රී ලංකාවේ ආර්ථිකය (පුනර්)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
පැහැදිලි අත්අකුරින් පිළිතුරු සැපයිය යුතුය.

කාලය : පැය 03

---

01. (අ) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වැවිලි බෝග සහ ඒ ආශ්‍රිත කටයුතු වලට පමණක් බොහෝ දුරට සීමා වීමට බලපෑ හේතු සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) 'ආර්ථික ද්විත්ව වාදය' යන්න පැහැදිලි කොට ශ්‍රී ලංකාවේ යටත් විජිත ආර්ථිකය ද්විත්ව ආර්ථිකයක් වශයෙන් හැඳින්වීම කොතෙක් දුරට යෝග්‍යයද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

02. "නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකය තුළ රජය සමාජ සුබ සාධනය සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් වැය කිරීම ආර්ථික වර්ධනයට බාධාවක් විය". විචාරාත්මක ඇගයීමක යෙදෙන්න.

(ලකුණු 20)

03. (අ) "ස්ථිර ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක් පහසුකර වීම සඳහා කෘෂි අංශයේ සහ කර්මාන්ත අංශය අන්‍යොන්‍ය වශයෙන් වර්ධනය විය යුතුය". ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.

(ලකුණු 10)

(ආ) කාර්මික අංශයේ සැබෑ ප්‍රවර්ධනයක් උදෙසා වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කාර්මික ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග ලක්ෂණ කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)

04. (අ) දරිද්‍රතා සංකල්පය නිර්වචනය කොට දරිද්‍රතා හිතෙශී ආර්ථික වර්ධනය යනුවෙන් කුමක් අදහස් වන්නේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රාදේශීය විෂමතාවන් පෙන්නුම් කිරීමට බලපාන ලද හේතු සංඛ්‍යා දත්ත උපයෝගී කොට ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

05. (අ) ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය (ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය) නිර්වචනය කරන්න.

(ලකුණු 06)

(ආ) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය සාපේක්ෂ වශයෙන් පහල මට්ටමක පැවතීමට හේතු කවරේද?

(ලකුණු 07)

(ඇ) ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටළුවේ ව්‍යුහාත්මක ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

06. (අ) සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක වන 'පහත් මට්ටමේ සමතුලිතතා පාෂය/උගුල' (Low Level Equilibrium Trap) යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(ආ) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩිවීමේ ආර්ථික හා සමාජීය ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 08)

07. පහත සඳහන් ඕනෑම තුනක් (03) පිළිබඳව විග්‍රහාත්මක සටහන් ලියන්න.

(අ) නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය

(ආ) මැදි ආදායම් උගුල

(ඇ) මානව හිතවාදී යහ පාලන පිළිබඳ දර්ශකය

(ඉ) මානව දරිද්‍රතා දර්ශකය

(කොටස් තුනකට ලකුණු 20)

@@@@@@@